**පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතිය - 2018**

---

පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹි අංක 5792 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමෙහි 2 (ආ) (3) වගන්තිය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකණු ලබන අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය නියෝජිතායතනය වන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ශ්‍රී ලංකාවේ තෝරාගත් ස්ථානයන්හී සංරක්ෂණ අරමුණු හා ප්‍රජාවේ ප්‍රතිලාභ සඳහා පරිසර පද්ධති කළමනාකරණ තත්ත්ව වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. නියමු භූ දර්ශන සැලසුම් කිරීම හා කළමනාකරණ, ස්වභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහ මිනිස් අලි සහජීවනය සහ රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය පිළිබඳ ආයතනික කුසලතා සංවර්ධනය යන ප්‍රධාන කොටස් 03 ක් යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ. ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,504.75 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 45ක් වන අතර මුළු ණය ප්‍රමාණයම මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2021 ජුනි 30 දින නිම කිරීමට නියමිතය.

**1.3 මතය**

---

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

----------------------------

## 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් හි භෞතික ප්‍රගතිය

-------------------------------------------------

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| -------------------- | ----------- | -------------------- | -------------- |
| ව්‍යාපෘතිය විසින් පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාව සමාලෝචනයට භාජනය වූ | ව්‍යාපෘතියේ ප්‍රගතිය සංසන්දනය කිරීම සඳහා අධීක්ෂණ | පිළිතුරු ලබා දී නොමැත. | සමාලෝචනය සඳහා ප්‍රගති වාර්තාව ක්‍රියාකාරී සැලැස්මට |

| | | | |
|---|---|---|---|
| වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූල නොවූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය විගණනයේදී නිරීක්ෂණය කළ නොහැකි විය. | යාන්ත්‍රණයක් නොමැති වීම. | | අනුකූල විය යුතුය. |

## 2.2 ව්‍යාපෘති අරමුණුවලින් බැහැරව සිදුකරන ලද බාහිර ක්‍රියාකාරකම්/ ගෙවීම්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ත්‍රිකුණාමලය සහ යාපනය සංචාරක නිවාසවල භාවිතය සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා වැය කළ රු.මිලියන 6.15 ක වියදම ව්‍යාපෘතියේ වැය විෂයයෙන් බැහැරව පැවතුණි. | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු කළ පිරිවැය ඉක්මයාම. | මෙම කරුණු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර කෙටි කාලයක් තුළ අදාළ පිළිතුරු සැපයීමට අපේක්ෂා කෙරේ. කෙසේවෙතත් ක්‍රියාත්මක කිරීමේ ආයතන දෙකකට ව්‍යාපෘති විෂයය පථයට අනුව කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා අරමුදල් භාවිතා කිරීම සහතික කිරීම අවශ්‍ය බව. |
| (ආ) ක්ෂේත්‍ර කාර්යමණ්ඩලයේ භාවිතය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 112.5ක වියදමින් මිලදී ගත් වාහන 03 ක් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය හා ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට වෙන්කර ඇති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ අරමුණු සඳහා වත්කම් භාවිතා කිරීම | ක්‍රියාත්මක කරන ආයතන දෙකෙහි ධාරිතාවය වැඩිදියුණු කිරීමේ අදහසින් PMU ප්‍රසම්පාදනය කර ක්ෂේත්‍ර රාජකාරී සඳහා එම වාහන මාරු කරන ලදි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීම සහතික කිරීම අවශ්‍ය වේ. |

## 2.3 මතභේදාත්මක ස්වභාවයේ කරුණු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| පරිසර සංරක්ෂණ අරමුණු සම්බන්ධ රූපවාහිනි වැඩසටහන් 08 ක් නිෂ්පාදනය කිරීම හා විකාශනය කිරීම සඳහා පෞද්ගලික පාර්ශවයකට රු.මිලියන 7.24 ක ඇස්තමේන්තුගත කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විටද රු.මිලියන 5.40 ක වියදමින් නිෂ්පාදනය කරන ලද වැඩසටහන් විකාශනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කර ගැනීමට නොහැකි විය. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේදී වැඩසටහන් විකාශනය කිරීමට අපේක්ෂා කරන අතර මූල්‍ය ආධාර ඉල්ලුම්කළ ව්‍යාපෘති යෝජනාවක් PMU වෙත ඉදිරිපත් කර තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ලබාකර ගැනීම අවශ්‍ය වේ. |

## 2.4 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අයිතිකරු සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව කුලියට ගත් ගොඩනැගිල්ලක් නඩත්තු කිරීම සඳහා රු.මිලියන 3.14 ක් වැය කර ඇත. | ඵල රහිත වියදම්. | PMU විසින් 2018 මාර්තු 28 වන දින ගොඩනැගිලි හිමිකරු සමඟ ගිවිසුමක් ඇති කර ගන්නා ලදි. මේ වන විට PMU මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටින අතර අනාගත කුලී වියදමෙන් මෙම නඩත්තු වියදම අඩු කිරීමට සාකච්ඡා කෙරෙමින් ඇත. | මතභේද සහ නාස්තිකාර වියදම් වලක්වා ගැනීම සඳහා කුලී ගිවිසුමේ වගන්ති පිළිපැදීම අවශ්‍යවේ. |